# මාධ්‍ය නිවේදනය

## රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය - 2016

**අද (2016 නොවැම්බර් 17) පෙ.ව. 9:30 සිට පෙ.ව. 11:30 දක්වා**

දු.අ.: 94-11-2147001 ෆැක්ස් අංකය: 94-11-2147011 විද්‍යුත් තැපැල: information@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය අද (නොවැම්බර් 17) දින පෙ.ව. 9:30 සිට පෙ.ව. 11:30 දක්වා රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වේ.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සියලුම සේවා නියුක්තිකයින් ගණන් ගැනීමේ සහ ඔවුන්ගේ ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ- ආර්ථික තොරතුරු රැස් කිරීම මෙම සංගණනයේ මූලික අරමුණ වේ. මෙම සංගණන මගින් සම්පාදනය කරනු ලබන තොරතුරු රාජ්‍ය සේවයේ ගුණාත්මක බව තවදුරටත් වර්ධනය කිරීම සඳහා උපකාරී වේ.

දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි (www.statistics.gov.lk) සහ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන වලට ලබා දී ඇති මුද්‍රිත උපදෙස් පරිශීලනය කොට අද දින සංගණන ප්‍රශ්නාවලිය සම්පූර්ණ කොට මෙම සංගණනයට සහය දක්වන මෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මහතා සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගෙන් ඉල්ලීමක් කරයි.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව